# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2116/48 - 2019 මාර්තු මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2019.03.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 15/2014

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 55 වන වගන්තියේ (2) වන උප වගන්තිය සමග කියවිය යුතු,එම පනතේ 58 වන වගන්තිය යටතේ නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**සජිත් ප්‍රේමදාස,**
නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2019 මාර්තු මස 06 වැනි දින
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2019 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (තොරතුරු ලේකම් කාර්යාලය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 55 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ (මෙහි මින්මතු "අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් පිහිටුවන ලද තොරතුරු ලේකම් කාර්යාලයේ කර්තව්‍ය මෙහි උපලේඛනයේ I වන කොටසේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

3. සිය කර්තව්‍ය ඉටු කිරීමේ දී තොරතුරු ලේකම් කාර්යාලය විසින් අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය මෙහි උපලේඛනයේ II වන කොටසේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

4. සිය කර්තව්‍ය කරගෙන යෑමේ දී තොරතුරු ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යා යුතු කාර්යසාධන ප්‍රමිති මෙහි උපලේඛනයේ III වන කොටසෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

## උපලේඛනය

I වන කොටස

**තොරතුරු ලේකම් කාර්යාලයේ කර්තව්‍ය.**

තොරතුරු ලේකම් කාර්යාලයේ කර්තව්‍ය විය යුත්තේ -:

(අ) ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳ ජාතික දත්ත සැකසුමක් පවත්වාගෙන යෑම;

(ආ) අධිකාරිය වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත තොරතුරු බෙදා හැරීම;

(ඇ) ඉදිකිරීම් කර්මාන්තයේ පරදු දරන්නන් සම්බන්ධයෙන් නාමාවලි පවත්වාගෙන යෑම; සහ

(ඈ) වෘත්තිකයන් සහ කාර්මික විශේෂඥයන් බිහි කරන්නා වූ රාජ්‍ය අංශයේ ආයතන, විශ්වවිද්‍යාල සහ වෙනත් අධ්‍යයන ආයතන සමඟ සම්බන්ධතා ඇතිකර ගැනීම.

II වන කොටස

**කාර්යපටිපාටි**

(අ) නිශ්චිත ආකෘති මගින් ජාතික දත්ත සැකසුම සඳහා පහත කාණ්ඩ අනුව දත්ත රැස් කරනු ලැබිය යුතු ය :-

(i) පිරිනමන ලද ඉදිකිරීම් වැඩ;

(ii) කරමින් පවතින සහ සම්පූර්ණ කරන ලද ඉදිකිරීම් වැඩ;

(iii) ඉදිකිරීම් ද්‍රව්‍ය සහ උපාංග ලැබීම්;

(iv) ශ්‍රම ඉල්ලුම සහ සැපයුම;

(v) ඉදිකිරීම් වැඩ සඳහා මූල්‍ය පහසුකම් ; සහ

(vi) මානව සම්පත් පුහුණුව හා සංවර්ධනය සැපයීම්.

(ආ) රැස් කරන ලද දත්ත සකස් කර, විශ්ලේෂණය කර සම්මත, වගුගත හෝ ප්‍රස්ථාරමය ආකෘති අනුව හෝ වෙනත් යම් අවශ්‍ය ආකාරයකින් පළකිරීම් හෝ අර්ථ නිරූපණය කිරීම් කරනු ලැබිය යුතු ය.

(ඇ) මෘදු ආකෘතියෙන් විද්‍යුත් තැපැල හරහා සහ දෘඪ ආකෘතියෙන් තැපැල හරහා

(i) අධිකාරියේ ලියාපදිංචි වී ඇති සාමාජිකයන්; සහ

(ii) තොරතුරු පද්ධතිය සඳහා දායකවන්නන්

වෙත තොරතුරු බෙදා දීම.

(ඈ) නාමාවලි සමඟ වෘත්තීය ආයතන සම්බන්ධ කිරීම සඳහා සම්බන්ධතා සැපයීම ද ඇතුළුව දායකවන්නන්ට ප්‍රවේශ විය හැකි නාමාවලිවල ලියාපදිංචි වූ පරදු දරන්නන් ලැයිස්තුගත කිරීම.

III වන කොටස

**කාර්ය සාධනය සඳහා ප්‍රමිති**

(අ) අධිකාරියේ සියලු දත්ත සම්බන්ධයෙන් අධිකාරිය සතුව කර්තෘ අයිතිය තිබිය යුතු ය.

(ආ) බාහිරින් රැස් කරන ලද සියලු දත්ත අදාළ උද්ධෘත සහ යොමු කිරීම් සහිතව තිබිය යුතු ය.

(ඇ) ලේකම් කාර්යාලය විසින් සපයන ලද සියලු තොරතුරු සහ බෙදා හරින ලද දත්ත වරින්වර වලංගු කරනු ලැබිය යුතු ය.

(ඈ) ලේකම් කාර්යාලය විසින්, ලියාපදිංචි පරදු දරන්නන් පිළිබඳ නිරවද්‍ය සහ සම්පූර්ණ නාමාවලි පවත්වාගෙන යා යුතු ය.

03-1068

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.